# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1936/33 - 2015 ඔක්තෝබර් මස 14 වැනි බදාදා - 2015.10.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

2015 අංක 01 දරන මධ්‍යම පළාත් සභාවේ බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් 2015.10.06 දින සම්මත කරන ලදුව 2015.10.07 වැනි දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කොට ඇති ඉහත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළකරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල,අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා
බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 09 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය කෙටුම්පත**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාතේ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දිනයේ සිට බලාත්මක වන්නේ ය.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) වාක්‍යාංශය වෙනුවට පහත දැක්වෙන අලුත් වාක්‍යාංශය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ආ) මෙම ප්‍රඥප්තියේ 46 (1) වගන්තියේ විධිවිධාන පරිදි සකස් කරන ලද සාධන පත්‍රයක් හා

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වගන්තියේ 3 වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

(3) ආදායම් කොමසාරිස්වරයා විසින් තැන්පත් කරන ලෙසට බලපත්‍රලාභියා වෙත දන්වනු ලබන ඇප මුදල හෝ ඇප මුදල් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත තැන්පත් කරනු ලැබිය යුතු අතර, ව්‍යාපාරය වසා දැමීමේදී හෝ පැවරීමේදී හැර තැන්පත් මුදල තැන්පත්කරුට ආපසු ගෙවනු නොලැබිය යුතුය. එසේ වුවද, බලපත්‍රලාභියා විසින් භාණ්ඩ උකස් කරුවකු හෝ උකස් කරුවන් වෙත කිසියම් මුදලක් ගෙවිය යුතු වේ නම් එම මුදල, තැන්පත් මුදලින් අඩුකරගනු ලැබිය යුතුය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

බලපත්‍රධාරීන්ගේ නම හා ලිපිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට ලේඛනය

13 (1) වාර්ෂිකව බලපත්‍රලාභී සෑම බඩු උකස් ගන්නෙකුගේම නම, ව්‍යාපාර නාමය සහ එම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ලිපිනය ;

(2) පහත 39 වගන්තිය යටතේ වරදකරු කරනු ලබන සෑම අවස්ථාවකදීම එම තැනැත්තාගේ නම, පෞද්ගලික ලිපිනය, ව්‍යාපාර නාමය, ව්‍යාපාරය පවත්වා ගෙන ගිය ස්ථානයේ ලිපිනය ද, යම් බලපත්‍රලාභියෙකුගේ බලපත්‍රය වලංගු කාලය ඉක්ම ගොස් තිබේ නම් සහ අනුගාමී වර්ෂයට බලපත්‍රයක් නිකුත් නොකරන ලද්දේ නම්, හෝ, ආදායම් කොමසාරිස්වරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

ව්‍යාපාරය ඇවර කර ගණන් බේරා වසා දමනු ලබන විට එහි වගකීම නිරවුල් කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වගන්තියේ 3 වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

(3) යම් තැනැත්තෙකු විසින් බඩු උකස් ගන්නකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යෑම අත්හරින ලද අවස්ථාවකදී ඔහු විසින් තබා ඇති ඇප මුදලින් (1) වන උපවගන්තියෙන් සඳහන් මුදල ගෙවීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් වේ නම් එම මුදල අඩුකරගෙන ඉතුරු මුදල ඒ බඩු උකස්ගන්නාට ගෙවිය යුතුය.

අනනුකූලතාවයන් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

6. මේ පනතේ සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර, යම් අනනුකූලතාවයන් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

මධ්‍යම පළාත් සභාවේ 2015 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධිත) ප්‍රඥප්ති කෙටුම්පත 2015.10.06 දින පැවති මධ්‍යම පළාත් සභා රැස්වීමේදී ඒකමතිකව සභා සම්මත වූ බව සහතික කරමි.

10 - 1090

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.